# සොඳුරු දර්ශනිකයා

## විජේරත්න පතිරාජ

හිරිගඬු පිපෙන දරදඬු සීත සෘතුව සිත මෙන්ම ගතද හෙම්බත් කර ඇත. එම සීතල කැටිය ගෙයි සවිකර ඇති විදුලි උඳුනට ලෙහෙසියෙන් වර්ධනය කළ හැක්කක් නොවේ. ගස්වැල් අඹරා හඹා එන සක්‍රීය සුළං රැළි නිසා අසාවකටවත්, හිරු එළිය ඇති මොහොතක කාමරයෙන් පිටතට පැමිණ ආස්වාදයක් ලබන්නට ඉස්පාසුවක් ලබා නොදෙයි.

තිළිණ පුතාගේ සිගිති දියණිය දැක බලා සුරතල් කිරීමට මෙල්බන් පුරවරයට පැමිණ ගතවන අටවන මාසයයි මේ. මාත්, බිරිඳත් අප සතු සියල්ල හැරදමා ගෙවල්, දොරවල් වසා දමා පැමිණ මේ ගතකරපු දුෂ්කර ක්‍රියාව සිගිති දියණියගේ සුරතල් කෙළිලොල් හැසිරීමෙන් ආශ්වාදයක් බවට පත්වන්නේ කෙතරම් විශ්මය ජනක විලසින් ද ? දාරක ප්‍රේමය කොතරම් ලයාන්විත අධ්‍යාත්මික සෙනෙහසක්ද ? සුප්පා දේවිය සියල්ල හැරදා ගල්ලෙනෙන් පිටව වී යන සිංහබාහු සමග එක්වන්නේ "දරුවන් සන්දා කරපණම් මෙබන්දා" යන උදාර ප්‍රාර්ථනයෙනි. අපගේ ප්‍රාර්ථනාද එසේ නොවන්නේද ?

දරුවන් වෙනුවෙන්, දරුවන්ගේ දරුවන් වෙනුවෙන් වැඩිහිටි මව්පියන්ට කොතරම් කැපකිරීම්, ඉවසීම්, ප්‍රාර්ථනා ඉටුකළ හැකි වුවත්, දේශයකින් දේශයකට පැමිණ සියළු පහසුකම් මැද වුවද කල්ගත කිරීමේදී මුහුණපමට සිදුවන නුපුරුදු කාලගුණික, පාරිසරික දුෂ්කරතා අතර හුදකලා බවද ප්‍රධාන තැනක් ගනී. ඊට ප්‍රධාන හේතුව තමා ළඟ ගොඩනැගෙන සිතැඟියාවන් හුවමාරු කරගැනීමට සරිලන තම මව් රටේ මෙන් අසල් වැසි පරිසරයක් නොමැතිවීමය. ගේ වටා ඇති තාප්පය හෝ වැටවල් වලින් කොටු වු ලෝකය ගෙයි හිටියත් පුතා එම දියණිය උදේ කාර්යාලයට පිටත්ව ගිය කල ආගන්තුක වුවන්ට පාළුවක්, හුදකලාවක් ඇති කිරීම පුදුමයක් නොවේ. මෙම ඒකාකාරී බව සිදි බිදී යන්නේ ඉඳ හිට පැමිණෙන හිතවත් ඥාති මිත්‍රවරුන් සමඟ පැවැත්වෙන සාදවලින් පමණකි. අපගේ මව් බසින් කතාව, සිනාව, නැටුම, ගැයුම සමග සිදුවන භාව අවස්ථා චමත්කාර ජනකය. අදත් මේ උදා වී ඇත්තේ එවන් මාහැඟි මොහොතකැයි සිත ප්‍රබෝධමත් කරවයි.

විශේෂ අමුත්තකු ලෙස අද සමරසේන ගුණසේකරයන්ගේ පැමිණීම කීප ආකාරයකින් අපට සතුටුදායක ආරංචියක් විය. අපේ තිළිණ පුතාගේ බිරිද වන සුරම්‍යා දියනියගේ පියා සහ මව් සමඟ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරියෙකු මෙන් ම පවුලේ ඉතා සමීප හිතවතකු ලෙස දීර්ඝ කාලයක් සම්බන්ධවී තිබිමත් දුරින් ඥාති සම්බන්ධයක් තිබිමත් එහිදි ප්‍රමුඛ විය. එසේම සිඩ්නි නුවර පදිංචි තම දරු මුණුපුරන් බැලීමට පැමිණි ගමනේ කොටසක් ලෙස අප හමුවීමට පැමිණීම අන්තර් සුහදතාවයට කළ ගරු කිරීමක්ද විය.

සමරසේකරයන්ගේ පැමිණීම මට ආකර්ශනයක් ඇති කළේ මීට වසර පහකට පමණ පෙර ඔහු හමු වූ එකම උත්සව අවස්ථාවකදී හමු වී ඇසුරෙහිදී ඔහුගේ කතා විලාසයට මගේ සිත පැහැරගෙන තිබීමය. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල උප දිසාපති තනතුරෙහි සිට විවිධ තනතුරු වලදී ලැබු අත්දැකිම් හා අත්හදා බැලීම් වලින් බව ඔහු කෝෂ්ඨාගාරයක් බවට පත්ව තිබු බව මට මතකය. එවැනි තොරතුරු විමර්ශනය කිරීමට මා තුළ තිබු කුතුහලය හාර අවුස්සා බැලිමට ලැබුණ දුර්ලභ අවස්ථාවක් උදාවීමක් ලෙස එය මට හැගුනි. ඔහු උග්‍ර වාමාංශිකයෙකු මෙන්ම යථාර්තවාදී ජීවිතය ලෙස විප්ලවකාරී දෘෂ්ඨි කෝණයකින් ක්‍රියාකරන්නකු ලෙසද ප්‍රකට විය. අද විශ්‍රාමික වයස වසර හැත්තෑව ඉක්මවා සිටියත් එම පෞරුෂයේ අඩුවීමක් නොවිය.

ඔහු සවස පහට පමණ පර්න් ට්‍රි ගලි හි අප නිවසට ලගාවුයේ අප බලාපොරොත්තු වු පරිදිම නිදහස්ව රාත්‍රිය අප සමග ගත කිරීමටය. පුතා ප්‍රමුඛ ලේලිය සමග මටත්, බිරිඳත්, එදින අප සමග එක් වූ නොක්ස්වල පදිංචි ඥාති පුත්‍ර රාජිත ප්‍රමුඛ පවුලේ අය විසිනුත් ඔහුව පිළිගන්නේ උණුසුම් විලසිනි. සාමාන්‍ය ආගිය තොරතුරු සැපදුක් සීත කාලගුණය සමග අප ලබන නුහුරු අත්දැකිම් ආදිය හුවමාරු කර ගනිමින් පිළිසරඳට අප යොමුවුයේ කෙටි කෑම සමග මධුපාන සංග්‍රහයටය.

ඕස්ට්‍රේලියාව ශත වර්ෂ දෙකක් වැනි කෙටි කාලයක් තුල ලබා ඇති ආර්ථික දේශපාලන හා සමාජ ප්‍රබෝධය කාගේත් පැසසුමට භාජනය වුයේ දැනට ශ්‍රී ලංකාවේ සිදුවන සමස්ත ගරා වැටීම් පිළිබඳ පොදු සන්තාපය සිහිපත් කරමිනි. එවැනි තත්වයක් හමුවේ සංක්‍රමණිකයන් ලෙසට මෙහි පැමිණ පදිංචිවන සිංහල ජාතියේ අනාගත සුරක්ෂිතාව පිළිබඳ නැවත ගැටළු අවධානයට යොමුවිය.

ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ ඇති ඇතැම් ආගමික චින්තන රටෙහි භෞතික දියුණුවට බාධකයක් බව සමරවීරයන්ගේ තර්කය විය. විශ්ව විද්‍යාල ජීවිතයේදී මගේ ජීවිතය හැඩගසා ගන්නේ භෞතික චින්තනයට බරවයි. මට කෙලවරක් නැති වැඳුම් පිදුම්, චාරිත්‍ර වාරිත්‍ර, හඳහන්, නැකත් කොටින්ම කියනවා නම් පුනරුප්තිතිය ගැනත් ප්‍රශ්න තියෙනවා. ඒවායෙහි සත්‍ය පිළිබඳව අපට විද්‍යාත්මක සාධක තිබෙනවාද ? ඔහුගේ ප්‍රශ්නවලට විවාද මතු විය. යුරෝපීය රටවල පරිසර සාධක දේවත්වයට පත්කර ගෙන ලෝකය ජය ගන්නා අතර, අපි ජීවිතයේ සෑම දෙයක්ම නක්ෂත්‍ර කරුවන්ට හා අද්භූත බලවේගයන්ට බාරදී, වැඳ වැටෙන ජාතියක් ලෙසට පත්වීම ඔහුගේ දැඩි දෝෂ දර්ශනයට ලක් විය. එම අදහස් වල ගැඹුරු අරුතක් ද අන්තර්ගත විය.

''සමරේ කවදාවත් වන්දනාවක් නැකත් බලා වැඩ කටයුතු කිරීමක් කරලා නැද්ද ?'' මගේ ප්‍රශ්නයට ක්ෂණිකව පිළිතුරු දුන් ඔහු ''මම කවදාවත් නැකත් බලල නැහැ.'' මට වැඩක් කරන්න අවශ්‍ය අනෙක් සාධක සම්පූර්ණ නම් ඒ මොහොත මගේ නැකත වෙනවා. අපේ ගෙවල් වල අය නැකත් හදන්න මට බල කලාම මට ගැලපෙන වේලාවක් දෙනවා. ඉතින් සෑම වැඩක්ම සාර්ථකව වෙලා තියෙනවා. මම කවදාවත් මගේ ළමයින්ට මටවත් අනුන්ටත් වඳින්න පුරුදු කලේ නැහැ. මොකටද කාටවත් වැඳ වැටෙන්නේ. ඒක හීන මානයක්. ඔවා හින්දු චාරිත්‍ර වලින් අපි හඳුනාගත් ක්‍රම සිංහල අළුත් අවුරුදු වලට බුලත් දී වැඩිහිටියන්ට වැඳීම වුවත් අනවශ්‍ය චාරිත්‍රයක් බව ඔහුගේ මතය විය. සෑම ආගමකම එන යහපත් පැවැත්මක් තිබීමේ උතුම් දර්ශනය තම එකම පිළිගැනීම බව ප්‍රකාශ විනි.

වැඳුම් පිදුම් චාරිත්‍ර ගැන තිලක්ගේ අදහස මොකක්ද ? සමරේ එක්වරම මගෙන් ප්‍රශ්න කලේය. සමරේගේ මතිමතාන්තර අතරට මගේ පිළිගැනිම් කෙසේ ගෙන හැර දැක්විය යුතුද යන්න මට ප්‍රශ්නයක් විය. අන්ද භක්තියෙන් කෙරෙන ආමිස පූජාවන්ගේ

35 වන පිටට

සන්නස SANNASA CARTOON By PK

